GRADUATE NURSES FOUNDATION OF SRI LANKA
2003
EDUCATION FOR EXCELLENCE

# NEW VISION

For Circulation Among Nurses Only

Educational Publication of Graduate Nurses' Foundation of Sri Lanka
(Affiliated to the Organization of Professional Associations - OPA)

July 2006 | Vol. 1 | No - 08 | Price - Rs. 10/-

# වත්මන් අභියෝග ජය ගැන්මට නම්........

01/2006 චක්‍රලේඛය, 06/2006 චක්‍රලේඛය හරහා හෙද සේවාවේ අනන්‍යතාවයට වූ හානිය, මෙතෙක් විඳි වරප්‍රසාද අනාගතයේදි අහිමි වීමට ඇති අවදානම, එක් එක් වෘත්තිකයින් විසින් මුද්‍රණය කළ බව සඳහන් අත් පත්‍රිකා, හෙද උපාධිය ආරම්භ කිරීමට විරුද්ධව ඇතැම් කොටස් විසින් කරනු ලබන විරෝධතා, උද්ඝෝෂණ, මේ සියල්ල හමුවේ තමාට නොවන ලෙස බලා සිටින අපි. මේ අනුව බලන කල 2006 වසර ශ්‍රී ලාංකික හෙද සේවාවට ඉතාම අභියෝගාත්මක කාලයක් ලෙස හැඳින්විය හැකිය. එහෙත් මෙම තත්වය නොදකින, නොදැනෙන හැඟීම් දැනීම් නොමැති ලෙස සිටින බොහෝ අපේම අයට මෙය ප්‍රශ්නයක් සේ නොපෙනිය හැකිය. එයයි හෙද වෘත්තියෙහි අවාසනාව.

විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ සමත්ව, හෙද විදුහල්වලට ඇතුලත්ව තුන් අවුරුද්දක් හෙද අධ්‍යාපනය හදාරන අප, වසරක් පාසා පැවැත්වෙන න්‍යායාත්මක හා ප්‍රායෝගික පරීක්ෂණවලින් සමත්ව හෙද සේවාවට වරම් ලබන අප, මුළු මහත් රෝහල් පද්ධතියේ සැබෑ ක්‍රියාකරුවන් වන අප මෙසේ උදාසිනව සිටින්නේ ඇයි? හෙද සේවාව මුහුන පා ඇති ප්‍රබල අභියෝගයන් හඳුනා ගෙන, ඒවා ජය ගැනිමට උත්සුක නොවන්නේ මන්ද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුත්තේ අප විසින්මය. වෙනත් කණ්ඩායම් අප ආක්‍රමනය කිරීමට මිස අපට අත්වැලක් වීමට ඉදිරිපත් නොවන බව පැහැදිලිය.

පැන නැගී ඇති අභියෝග හමුවේ ඔබගේ දායකත්වය සම්බන්ධව ඔබ ඔබෙන්ම විමසුමක් කළහොත්? කිමෙක් විය හැකිද පිළිතුර? "අනේ මට වෙලාව නැහැ, මම ඕවා දන්නේ නැහැ, එක එක සංගම් එක එක දේ කියන්නේ, ඒ නිසා අපට ඕවා තේරෙන්නේ නැහැ." තුන් අවුරුදු පුහුණුවක් ලත් ජාතික සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ කොඳු නාරටිය වන් ප්‍රබල වෘත්තියක සාමාජිකයෙකු වූ ඔබට, ඔබගේ වෘත්තිය ආරක්ෂා කිරීමට සහ එහි සංවර්ධනය සඳහා වූ වගකිමෙන් එසේ මිදිය හැකිද?

දයාබර සොයුර සොයුරිය, ඔබ මීට වඩා විමර්ශනාත්මක විය යුතු, ක්‍රියාශීලි විය යුතු මොහොත එළඹ ඇත. තතු ඇති සැටියෙන් අවබෝධ කර ගැනිම වැදගත්. අප සේවාවට. අවශ්‍ය මොහොතක අපගේ දායකත්වය දිමට පසුබට නොවිය යුතුය.

එමෙන්ම බුද්ධිමත් වෘත්තිකයකු ලෙස තමා විසින්ම කරුණු අධ්‍යනය කළ යුතුයි. නොපැහැදිලි තැන් විමසුමට බඳුන් කළ යුතුයි. එවිට ඔබ රැවටීමට තව අයෙකුට නොහැකි වනු ඇත. තව අයෙකුගෙන් ප්‍රශ්න කිරීමට ඒ අනුව ඔබට හැකියාව ලැබෙනු ඇත.

ජාත්‍යන්තර හෙද වෘත්තිය දිනෙන් දින වෛද්‍ය සේවාව පරයා ඉදිරියට යන යුගයක හෙද වෘත්තියේ අනන්‍යතාවය, ස්වාධිනත්වය අද්විතිය ලෙස වර්ධනය වී ඇති යුගයක ශ්‍රී ලාංකික හෙද සේවාව සම්බන්ධ තිරණ රැදී පවතින්නේ කවුරුන් අතේද? ජාත්‍යයන්තර හෙද සේවාව අපට සැම විටම අත්වැලක්ව පවතිද්දි, ශ්‍රී ලාංකික හෙද සේවාව වහල් යුගයකට තල්ලු කිරීමට අර අඳින, හෙද හෙදියන්ගේ හැකියාවන් මොට කරන, කියන දේ කරන, මානසික තත්වයකට ඔවුන් පත් කිරීමට උත්සුක වන ජාතික බල වේග වලට පහසුකම් සපයන්නේ කවුරුන්ද? සිතා බලන්න

වෘත්තියක් ලෙස, පුද්ගලයකු ලෙස උසස් අධ්‍යාපනය ලැබිමේ හා සංවර්ධනය විමේ අයිතිය සැම වෘත්තියකටම මෙන්ම පුද්ගලයකුට හිමිය එය මූලික මිනිස් අයිතිවාසිකමකි.

සැබෑ වෘත්තිකයෙකුගේ වගකිම වන්නේ අන් වෘත්තිකයන්ටත් සංවර්ධනය විමට අවස්ථාව සලසා දිමයි. එසේ නොමැතිව තම පන්තිය ආරක්ෂා කර ගැනිමට අන් අයට උසස් අධ්‍යාපනය සඳහා ඇතුළුවිමට ඇති ඉඩකඩ අසුරා තැබීමට යම් කණ්ඩායමක් උත්සහා දරන්නේ නම් සැබැවින්ම ඔවුන් තම වෘත්තියට මෙන්ම මිනිස් කමටත් කරන්නේ නිගාවකි. උසස් ශිල්ප හැදෑරීමට පෙර එබඳු පුද්ගලයන් අන් අයගේ මිනිස් අයිතිවාසිකම් හඳුනා ගැනිමට සහ ආරක්ෂා කිරීමට උගත යුතුයි.

තමාගේ නිහඬත්වය සම්බන්ධයෙන් විමසන අවස්ථාවකදි අපේම ඇතැම් සහෝදර සහෝදරියන්ගේ තවත් මතයක්ව ඇත්තේ හෙද ආචාර ධර්ම විසින් තමා නිහඬ කර ඇති බවකි. ආචාර ධර්ම විසින් ඔබ කිසිම විටක නිහඬ කර නැත. අන් වෘත්තිකයන්ගේ සංවර්ධනයට අතහිත දෙන, රෝගියාගේ ආරක්ෂාව, රැකවරනය සහ සුභ සාධනය වෙනුවෙන් පෙනි සිටින, තම වෘත්තියේ ගෞරවය ආරක්ෂා කරන, සේවාවේ සංවර්ධනය සඳහා කැපවුන, හෙද හෙදියන්ගේ සාමාජිය ආර්ථික තත්වයන් නංවාලිම සඳහා මෙන්ම යහපත් වැඩ පරිසරයක් ඇති කිරීමට කටයුතු කරන පුද්ගලයකු බවට හෙද ආචාර ධර්ම මගින් ඔබව පත්කර ඇත. ආචාර ධර්ම වැරදි ලෙස නිර්වචනය කර ගැනිම අපට අහිතකර විය හැකිය.

අවසාන වශයෙන් මා මෙසේ සටහන් කිරීමට කැමැත්තෙමි. නිද්‍රාවට පත්ව ඇති ඔබ අවදි කරවනු සඳහා මා තැබූ මෙම සටහන මගින් කිසිම විටෙක ඔබට විප්ලවයකට ආරාධනා නොකරමි. එහෙත් ඔබ තුල "මානසික විප්ලවයක්" ඇතිවිය යුතුමය. ඔබගේ ක්‍රියාශීලි බව, විමසුම් සහගත බව වර්ධනය විය යුතුයි.

ශ්‍රී ලාංකික හෙද හෙදියන් ලෙස අප එකමුතු විය යුතුයි. ඒකරාශි විය යුතුයි. එක්සත්ව එක්සිත්ව අප සේවාවේ සංවර්ධනය සඳහා මෙම අවස්ථාවේ ක්‍රියාකල යුතුයි. උසස් අධ්‍යාපනය කෙරෙහි ඇති නැඹුරුව වඩ වඩාත් වර්ධනය කර ගැනිම, ඒ සඳහා යොමු වන්නන් ධෛර්‍යයමත් කිරීම, උසස් අධ්‍යාපනයට නිසි පිළිගැනිම ලබාදිම, අප සේවා වගකිම් අන් අයට පැහැර ගැනිමට ඉඩ නොදිම, තුන් අවුරුද්දක් තිස්සේ තමා ලබාගත් දැනුම වැඩි දියුණු කර ගැනිම, එමෙන්ම තම දැනුම ප්‍රදර්ශනය කිරීම හා භාවිතා කිරීම, ගුණාත්මක සේවාවක් ජනතාවට ලබදිම, කනිෂ්ඨයන්ට මග පෙන්වීම, හෙද සිසුන්ට ඉගෙනුම් අවස්ථා සලසා දිම, මග පෙන්වීම හා ආරක්ෂා කිරීම, අන් වෘත්තිකයන්ගේ සංවර්ධනයට අතහිත දිම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව තුල හෙද සේවාවේ අනන්‍යතාවය ස්වාධිනත්වය තහවුරු කිරීම සඳහා පෙල ගැසිය යුතුවේ.

පටු වාද භේද දුරලා හෙද හෙදියන් ලෙස එක් වී සේවාව ස්වර්ණමය යුගයකට ගෙන යමු. මූලික හෙද පාඨමාලාව විද්‍යාවේදි හෙද උපාධිය දක්වා ගෙන යාමට කටයුතු කරමු. විශ්ව විද්‍යාල පද්ධති වලින් බිහිවන හෙද උපාධිධාරීන්ගේ රැකියා අවස්ථා සේවාව තුල තහවුරු කරමින් හෙද සේවාව නවකයන්ට ආකර්ෂණීය ස්ථානයක් කරමු. එමෙන්ම දැනට සේවයේ නියැලෙන ඔබට උපාධි මට්ටම දක්වා ගමන් කිරීමට ආකර්ශණීය වැඩ පිළිවෙලක් නිර්මානය කර ගත හැකිය. හෙද අධ්‍යාපනයට ශ්‍රී ලංකාව තුල නිසි පිළිගැනිම නොලැබුනත්, අපගේ හෙද පාඨමාලාව ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඇමරිකාව වැනි දියුණු රටවල ඉතා ඉහල මට්ටමකින් පිළිගනු ලැබ ඇත.

එම පිළිගැනිම හා ඔවුන් තුල ඇති මානව හිතවාදි ගුණාංග හරහා අපට නව මාවත් විවර කර ගත හැකියි. මේ සඳහා අවශ්‍ය වන්නේ අප සැමගේ එකමුතු බවයි.


මාලිනි රණසිංහ.
සභාපතිනිය.
ශ්‍රී ලංකා උපාධිධාරී හෙද පදනම.

Contents

| TOPIC | PAGE |
|---|---|
| GNFSL - Puzzle No. 1 | 2 |
| අනාගතය උදෙසා වර්තමානය කැප කරමු. | 3 |
| Why Nursing is Important to the Public | 4 |
| Nurses Responsibilities in Disaster Management | 5 |
| Student Page | 6 |
| Planning of Clinical Experience for Nursing Students | 7 |
| Letter from Chief Executive Officer, I.C.N. | 8 |

# GNFSL - Puzzle No. 1

## a-z in Words - Abbreviations - Figures




**Clues**

a. How many universities have opened their portals to nurse undergraduates to read for a four-year degree course ? (figure)

b. With the opening of the Uva-Wellassa University, how many conventional universities have we in Sri Lanka ? (figure)

c. What is the umbrella association in which the GNFSL holds membership? (abbreviation)

d. How many other professional disciplines come under that association ? (figure)

e. In which zone in Colombo is its office situated? (figure)

f. How many years of existence does that association count? (figure)

g. Which other university besides a conventional university conducts a degree programme in nursing? (abbreviation)

h. How many Z- score passes does a candidate need to enter any conventional university ? (figure)

i. How many universities offer a baccalaureate degree in nursing irrespective of age? (figure)

j. How old is our own GNFSL? (figure)

k. What is the age limit for recruitment in the four year B.Sc. Nursing programme? (figure)

l. What is the office that comes next to the chancellor's in the university hierarchy? (abbreviation)

m. How many Sri Lankans obtained degrees in nursing from Indian universities on Ceylon Government Scholarships in the early nineteen fifties? (figure)

n. What is the professional association that enrolls both men and women nurses registered by the SLMC.

**Instructions**

1. Fill all blank squares with either capital Letters or Hindu-Arabic figures as indicated at the end of each clue.
2. Lack of clarity will not give you the benefit of any doubt.
3. The first three all correct entries drawn by the Executive Committee are entitled to prizes
4. The results will be given in the next "New Vision" Vol 1 No: 09.
5. The closing date for entries is 20th September 2006
6. The prizes will be awarded at the next AGM of the GNFSL.
7. Address your entries to ;
   The Editor, New Vision,
   C/O Principal,
   School of Nursing, Colombo

o. What is the duration of the post R.N. bachelors degree in nursing ? (figure)

p. Presently how many trail blazing nurse undergraduates are enrolled in the University of Sri Jayewardenepura ? (figure)

q. How many Schools of Nursing in Sri Lanka provides clinical training in Psychiatric Nursing? (figure)

r. What is the federation that offers membership exclusively to women graduates? (abbreviation)

s. How many nurses are holing positions of Directors of Nursing in the Ministry of Health?

t. How old is our oldest government School of Nursing?

u. To what educational level is the "certificate" offered by the three year nursing course expected to be elevated soon?

v. Through how many years does the baccalaureate degree course in nursing span? (figure)

w. What do universities confer of their convocations? (full word)

x. How many Schools of Nursing have been established by the state government in our country. (figure)

y. Akin to today's use of "UNI" what is the abbreviated word to mean "university" by the alumni of the good old days? (abbreviation)

z. Under which faculty does the OUSL confer the B.Sc. Nursing Degree? (abbreviation)

### From the Editors

Please send your contributions, views, suggestions, news & any other material that you wish to share with us.

**Address :** Secretary, GNFSL, School of Nursing, Colombo.
E-mail : gnfsrilanka@yahoo.com

**Editorial Board**
Ms. Trixie Marthenesz
Ms. S. M. K. S. Seneviratne
Ms. S. L. H. Vithanarachchi
Ms. K. D. L. Meegoda

## මව්වරුන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනයට මහජන හෙද සොයුරියකගේ ප්‍රයත්නයක්.......

# ගර්භනි මාතෘ ආශිර්වාද පිංකම



කඩුවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් තලංගම ක්ෂෙත්‍රයේ ගර්භනි මව්වරුන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය [illegible]ණිස විශේෂිත වු සදහම් වැඩ සටහනකි මෙම ගර්භනි මාතෘ ආශිර්වාද පිංකම.

ගමත්, පන්සලත්, පලාතේ සෞඛ්‍ය ක්ෂෙත්‍ර නිලධාරින් ද එකතු කර තලංගම මහජන සෞඛ්‍ය හෙද සොයුරිය කාන්ති බොතේජු මහත්මිය විසින් මෙම වැඩසටහන සංවිධානය කර තිබුනි. තලංගම ජයවඩනගම මෛත්‍රි ධර්මායතනයෙහි 2006.05.11 දින පැවැත්වු මෙම වැඩසටහන සඳහා තලංගම ම.සෞ.හෙද.සොයුරි ක්ෂෙත්‍රයේ පදිංචි ගර්භනි මව්වරු 300 කට ආසන්න ප්‍රමානයක් හා පියවරු සහභාගි වුහ.

මේ සඳහා තලංගම ජයවඩනගම මෛත්‍රිධර්මායතනයේ නායක ගුන්නැපාන විමලබුද්ධි ස්වාමින් වහන්සේ ඇතුලු භික්ෂුන් වහන්සේලාද, දායක සභාවද, දහම් පාසල් දරු දැරියන්ද මැනවින් දායක වී අවශ්‍ය සහයෝගය ලබාදුනි. මෙහිදි නායක ස්වාමින් වහන්සේ ඇතුලු භික්ෂුන් වහන්සේලා ගර්භනි මව්වරු උදෙසා පිරිත් දේශනයක් පවත්වන ලදි.

මෙවන් සදහම් ක්‍රියාකාරකම් තුලින් මවගේ මෙත් සිතුවිලි අවදිකර මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනයක් ඇති කරනු ලැබු අතර ගර්භනි මවගේ මානසික සෞඛ්‍ය නංවාලිමට පවුලේ අයගේ මැදිහත්වීම, සහයෝගය හා ඒ තුලින් පවුලේ සෞඛ්‍ය නංවාලිම පිළිබඳව විශේෂඥවෛද්‍ය නිල් ප්‍රනාන්දු මහතාගේ හරවත් කාලෝචිත දේශනයක් හා සාකච්ජාවක්ද සංවිධානය කර තිබුනි.

කොළඹ දිස්ත්‍රික් මාතෘ හා ළමා වෛද්‍ය නිලධාරී ලලිත් ලියනගේ මයා, කොළඹ දිස්ත්‍රික් මාතෘ ප්‍ර.ප්‍ර.ම. සෞ.හෙ.නි.(වි.ශ්‍රේ) චිත්‍රානි පද්මලතා මිය, කඩුවෙල අතිරේක සෞ.වෛ.නි. ශ්‍රියානි ලියනගේ මිය, කඩුවෙල ම.සෞ.හෙද සොයුරියන්, තලංගම ක්ෂෙත්‍රයේ සියලුම ප.සෞ.සේ. නිලධාරීනින් ද මහජන සෞ. පරීක්ෂක මහතාද සහභාගි විය.

නැණවත් ගුණවත් සෞඛ්‍යමත් දරුවකු සමාජයට දයාද කිරීමට ගැබ්ගත් මව රැකබලා ගැනිම අප සැමගේ යුතුකමකි. ඒ සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කැප විමෙන් ක්‍රියා කල යුතුයි. මෙවර තම ක්ෂෙත්‍රය තුල පස්වන වරටත් මෙම අගනා වැඩසටහන සංවිධානය කල මෙම මහජන සෞඛ්‍ය හෙදසොයුරිය කාගේත් පැසසුමට ලක්විය යුතුය.

සැකසුම - සුජාතා සෙනෙවිරත්න

# අනාගතය උදෙසා වර්තමානය කැප කරමු

දයාබර හෙද හෙදියනි, හෙට්න් උදවන නව ලොවක අරුණළු පැතිරෙන මෙවන් සමයක.... ඔබ වෘත්තියෙහි අභිවෘද්ධිය උදෙසා යමක් සිතන්නට .... යමක් කරන්නට ... කාලය එළඹ ඇත.

ශ්‍රී ලාංකික හෙද සේවාවේ යම් කිසි අවාසනාවන්ත කාල පරිච්ඡේදයක් පසු කරමින් සිටින අප, පෞද්ගලිකවත්, වෘත්තිමයවත් නැගී සිටීමට යම්කිසි උත්සාහයන් ගතයුතු නොවේද? පෞද්ගලිකව තම තමන්ගේ උපරිම දයකත්වය තම වෘත්තිය වෙනුවෙන් ඵලදයී ලෙස යෙදවීම යනු වෘත්තියේ අභිවෘද්ධියට මාවත විවර කිරීමකි. මේ ගැන ඔබගේ පුළුල් අවධානය යොමුකිරීම ඉතාමත් කාලෝචිත බව මගේ හැඟීමයි.

බෞද්ධ දර්ශනයට අනුව අපි සැවොම පෘථග්ජන මනුෂ්‍යයෝ වෙමු. එම නිසා අප සැමවිටම මූලිකත්වය ලබාදෙනුයේ තමන්ටම බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේ නම් මේ සියල්ල අපි අප තුලින්ම අරඹමු.

ඔබ ඔබේ සිතට එකඟව හෙද වෘත්තියේ නියැලෙනවාද? ඔබ ජාත්‍යන්තරව පිළිගත් තුන් අවුරුදු න්‍යායික හා ප්‍රායෝගික පාඨමාලාවක් හදරා පරිපූර්ණ හෙදියන් ලෙස වෘත්තිය සුදුසුකම් ලබා ඇත. එසේ නම් ඔබ ඉගෙනගත් දෑ වඩාත් ඵලදයී ලෙස යොදා ගැනීම ඔබේත්, වෘත්තියෙත් දියුණුවේ රහසයි. මඳකට සිතා බලන්න. අපි එසේ කටයුතු කරනවාද? අපි එදිනෙදා රාජකාරී කටයුතු, රෝගී සාත්තුව ඒකාකාරී ලෙස, ගතානුගතිකව කරගෙන යාමට වඩාත් නැඹුරුවත් දක්වන බව බොහෝවිට දක්නට ලැබේ. ඔබ අප දන්නා පරිදි අපේ රෝගී සත්කාරය ඉතා ඉහලින් සිදුවන බව ද අප අමතක කළ යුතු නොවේ. නමුත් විද්‍යාත්මක පදනමත් සහිත ලොව පිලිගත් වෘත්තියත් ලෙස ලෙස දිනෙන් දින එක්වන නව දැනුම හා අත්වැල් බැඳ ඉදිරියට යන්නට ඔබ කී දෙනෙක් උත්සාහ කරනවාද? ඔබ, ඔබගේ දියුණුව උදෙසාවත් තම වෘත්තියේ ඉහල තනතුරු සඳහා තරඟ විභාග වලට ඉදිරිපත් වූයේද? අභ්‍යන්තර වැඩමුළු කාලීන දේශන ආදියට සහභාගි වූයේද? මදකට සිතා බලන්න. ඔබගේ වෘත්තිය පිළිබඳ නව දැනුම, නව අත්දැකීම් ලබාගැනීමට ඔබ තුල යම්කිසි වූ උනන්දුවක් තිබුණාද? ඔබ අමතක කරන්න එපා, ලොව බොහොමයක් ම රටවල හෙදියකගේ අවම සුදුසුකම විද්‍යාවේදී හෙද උපාධියයි. එතනින් නොනවතින ඔවුන් පශ්චාත් උපාධි (MSc) දර්ශනපති උපාධි (PhD) දක්වා ඉහලට ගමන් කරයි. මේනිසා ඔවුන් නව දැනුම තුල පදනම් වූ ලොව පිළිගත් වෘත්තියක ගෞරවය ඉදිරියට ම සක්‍රියව ගෙන යයි. ජාත්‍යන්තර හෙදිය සිටිනා ස්ථානය ගැන ඔබගේ අවධානය ඉතා තදින් යොමු කළ යුතුයි. ඔබත්, ඔබේ සම්ප්‍රදායෙන් බැහැරව හුදෙක් රැකියාවක් නොව වෘත්තියක අප නිරත වන බව පසක් කරගෙන පෞද්ගලිකව ඔබේ දියුණුව උදෙසාත්, එම දියුණුව වෘත්තියේ අභිවෘද්ධිය සඳහාත් දයක කරවීමටත්... වහ වහා උනන්දු වීම යුගයේ අවශ්‍යතාවකි. ඔබ තවදුරටත් මෙසේ ක්‍රියාත්මක වෙමින්, ස්වාධීනව කටයුතු කිරීමට. එකාවන්ව පෙළ නොගැසෙන්නේ නම් ශ්‍රී ලාංකික සෞඛ්‍ය ක්ෂෙත්‍රය තුල වෙනත් වෘත්තියන්ට යටත්වූ පරාධීන වෘත්තියක් බවට ශ්‍රී ලාංකික හෙද සේවාව පත්වීම, නොවැලක්විය හැකි වනු ඇත.

මේ පිළිබඳ ඔබගේ පුළුල් අවධානය යොමු කරමින්, තමාගේ වෘත්තිමය වගකීම කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්විය යුතුය. හෙට දින සියළු හෙද විදුහල් ක්‍රමිකව විශ්ව විද්‍යාල අධ්‍යයන අංශ බවට පත්කර ගනිමින් උපාධිධාරී හෙද පරපුරක් බිහි කරගැනීමට පෙළ ගැසිය යුතුය. එමෙන් ම ඔබ සැවොම උසස් අධ්‍යාපනය සඳහා ඔබගේ අවධානය යොමු කළයුතුය. ඔබේ වර්තමානය පෞද්ගලිකව ඔබගේත්, පොදුවේ වෘත්තියෙත් දියුණුවට කැප කිරීම ඔබගේ අනාගතයටත්, වෘත්තියේ අනාගතයටත් අරුණළු රැගෙන එනු ඇත. හෙට්න් ඇරඹෙන නව විශ්ව විද්‍යාලහෙද අංශයන් සඳහා අවශ්‍ය වන සම්පත් දයකත්වය ඔබට ලබාදීමට හැකි වනු ඇත. සිය ගණනින් ඉදිරියේ ඇති වන විශ්ව විද්‍යාල දේශක මණ්ඩල පුරප්පාඩු උදෙසා ඔබගේ දයකත්වය ලබාදීමට අද අදම සැලසුම් කරන්න. අපගේ වර්තමාන හෙද පරපුර, අනාගතය උදෙසා සූදනම් කිරීමට අද දින යම් කැප කිරීමක් කරන්නට ඔබ සූදනම් නම් එය ඔබගේත්, හෙද වෘත්තියේත් ශ්‍රී ලාංකීය හෙද සේවාවේත් තීරණාත්මක සංධිස්ථානයක් වනු ඇත.

සියළු පටු වාද භේද දුරලා, පොදුවේ ශ්‍රී ලාංකීය හෙද සේවාවට මුහුණපෑමට ඇති සියළු බාධක, අභියෝග ජයගන්නට, එකම සහෝදර හෙද පරපුරක් ලෙස එක්ව හෙට දවස උදෙසා අද දවස තුල අර්ථවත් යමක් කරන්නට, අධිෂ්ඨාන කරගන්න. අද ඔබගේ කැපවීම, හෙට දවසේ ඔබගේත්, හෙද වෘත්තියේත් අනාගතය බව කිසිවිට අමතක නොකරන්න.

බී. සුනිල් එස් ද සිල්වා BSc (Hons)
කථිකාචාර්ය
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

# Why Nursing is Important to the Public

**Nursing Profession**

Nursing Profession is a direct service, goal oriented and adaptable to the needs of the individual, the family and community during illness as well as in health. It's a direct service that is one of direct contact between nurse and family

Nursing has as its special concern for the individual's need for self-care, action and the provision and management of it on a continuous basis in order to sustain life and health, recover from disease or injury and cope with their effects.

The Canadian Nurses Association has developed the following philosophical statement about nursing."The nursing profession exists in response to a need of society and holds ideas related to man's health throughout his life span. Nurses direct their energies toward the promotion, maintenance and restoration of health, the prevention of illness, the alleviation of suffering and the ensuring of a peaceful death when life can no longer be sustained. Nurses value a holistic view of man and regard him as a bio-psycho-social being who has the capacity to set goals and make decisions and who has the right and responsibility to make informed choices congruent with his own beliefs and values". Nursing has its four fields of activity.

1. Practice according to the nursing process
2. Continuous, education for current knowledge
3. Administration for further development
4. Research for scientific basis

Modern nursing care includes a holistic focus. Care is provided not just for a particular disease or wound but also for the health of the whole person. The nursing activities not only assist those who are ill but also help those who are healthy to maintain wellness.

The nurse has nine main roles in relation to the care of patients and their families or support persons. The emphasis of each role varies with the situation. The nurse adapts skills and methods of care to these interrelated roles as needs arise.

The nine roles are,

1. Healing (Therapeutic) role
2. Caring (Comforting) role
3. Protecting role (Safety)
4. Teaching role
5. Planning role
6. Coordinating role
7. Communicating role
8. Rehabilitating role
9. Socializing role

**Do you know that there are assisting duties of nurses : to the public**

Helping is fundamental to the nursing profession. Some patients are more willing to receive assistance than others People have different needs and the nurse can be flexibie enough to adapt to them.

Nursing practice involves the patient either directly or indirectly. Direct activities are those carried out in the presence of the patient or support persons. Indirect activities are carried out on the patient's behalf but not in the patient's presence for example, a meeting between nurse and physician to discuss a change in medication for the patient. As the member of the health team closest to the patient is the nurse and assumes the role of patient advocate, acquainting the physician with the patients physical and emotional responses to treatment.

In providing care the nurse needs to be sensitive to the patient's needs and she must be aware of changes, select a methods of helping according to the requirements of the situation. There are five methods the public would be assisted by the nurse.

1) Acting for or doing for another.
2) Guiding another.
3) Supporting another (physical or psychologically)
4) Providing an environment that promotes development of another's ability to meet present or future demands for action.
5) Teaching another.

**1) Acting for or doing for another.**

The nurse's own abilities may be used so that the patient's needs are met. When a patient is unconscious, the care plan is carried out using the nurse's judgement and without the patients participation. And when doing management in the ward she coordinates the other staff.

**2) Guiding another for the patients.**

The nurse may guide a patient either verbally or by action. A example would be suggesting to a patient who was sitting in her chair for the first time after surgery that return to bed for a rest before becoming too tired. In this situation the nurse is guiding the patient using knowledge of the patient's health and strength.

**3) Supporting another**

A person may be supported either physically or emotionally by a nurse often both types of support are given at the same time. Support may often be regain independent functioning.

**4) Providing a developmental environment**

Nursing may provide an environment that helps a patient set and meet appropriate goals. A severely depressed person may require surroundings that are sunny, cheerful, and atmosphere that is safe, simple and unconfusing. Patients come to the hospital environment because of Nursing care. So providing developmental environment is a responsibility of nurse.

**5) Teaching another**

Nursing can assist patients by teaching them skills and knowledge. Appropriate activities need to be arranged for effective learning. For example for a pregnant woman to learn prenatal exercises, she usually needs an opportunity to carry out the exercises while the nurse is present to assist her.

Nursing curriculum that donates such qualified nurses to Sri Lanka is recognized by each country all over the world. That means the nurse in Sri Lanka can provide her nursing service to any individual who has ill health in the world. The nurse has capable of doing it without any extra training. Therefore the nursing in Sri Lanka should highly appreciated in our country as the world.

Mass media should have special responsibility to maintain the professional status of nursing because each profession serves to the public itself. Specially nursing is the profession which has knowledge, skills and attitudes to serve public, when the person is on mentally, physically, socially or spiritually ill. Such a profession should protect as valuable profession by the public because it is benifited to the public itself.

**K.D.L. Meegoda.** (RN, RM, BScN, MScN.)
Nursing Tutor, School of Nursing, Colombo.

# NURSES RESPONSIBILITIES IN DISASTER MANAGEMENT

The critical situations that have increased in the last three decades, have caused severe impact on life with loss of economic assets, damage to infrastructure, detriment to development opportunities and environmental degradation and also loss of life. Therefore, disaster management has emerged as the need of the day involving many sectors at different levels. Government NGO's, private sectors, health agents, Police, defense forces, academic institutions etc. One of the most important sectors is health.

**What is Disaster?**

A serious disruption of the functioning of society, causing widespread human, material, or environmental losses, which exceed the ability of the affected people to cope using their own resources.

**What is Disaster Management?**

The effective organization, direction and utilization of a viable counter of disaster resources.

An applied science consisting of a continuing process of systemic observation, analysis and dissemination, that allows the conscious, structuring of a series of events or conditions by timely and informed application of resources.

Disaster management applies both routine and crisis situations.


Routine Management : Non crisis period.

1) Mitigation 2) Reconstruction.

Crisis Management - emergency operation

1) Preparedness 2) Relief 3) Rehabilitation

First you have to do a need assessment and damage assessment.




**Public Health impact**

Disasters have the potential to significantly affect the public health of a community while medical facilities can sustain direct physical damage from a disaster. Access to medical care can also be disrupted due to road closures, traffic congestion gas shortages, telephone and utility outages, over worked. health personnel and other problems. Resources such as food, water and medicines, maybe depleted or unable to be accessed due to infrastructure damage. Disasters also have a significant psychological impact, with communities and individuals moving through discrete psychological stages of post disaster.

**Response protocols**

When a significant disaster occurs the first response will occur at the local level with the mobilization of the emergency medical systems, police, fire and other identified responders. Hospitals, health care organizations and public health agencies will activate their disaster plans. Red Cross and other voluntary agencies will respond.

Nurses can be optimally prepared for a disaster of any type by being aware of community hazards and vulnerabilities, as well as being familiar with the community health care system and its level of preparedness.

It is essential that nurses have a personal and family disaster plan. It's difficult to provide care to others when one is concerned about the safety of one's own family.

**Safety of one's family**

Nurses should be familiar with the disaster plan at their work places. It is also important to incrcase one's knowledge. Nurses may be called upon to educate patients and community members.

**Responsibilities of Nurses**

Preparedness is the main responsibility of the nurses. Furthermore,

- Participate in institutional disaster planning
- Identify the risks
- Assess the probable needs
- Assess available resources
- regular checks & updating human, material, transport and special equipment
- Compare needs with resources.
- Determine the operational procedures and review existing procedures.
- Assign responsibilities, ensure that every body is clear about who is responsible for what (Example - Remove and safeguard of property.)
- Finalize the plans.
- routine procedures to be followed, standing orders, check lists, emergency procedures.
- Practice the plan.
- Evaluate the plan
- On disaster response / activating the plan.
  - Ensure pre-arrival preparedness
  - Prepare to receive patients
  - Admit and treat patients using serially numbered disaster files
  - Receive casualties functioning in triage teams (Categorize the patients in the reception as first, aid resuscitation etc.)
  - Arrangements to secure the belongings of patients.
  - Documentation and data collection.

    Example :- Registration of patients and preparing of statistical data
  - Psychological support to victims and their family members.

To page 07




## අපූර්වත්වය ....

එය දිය පිරි සැලියකි.
ඇඳුරුතුමන්ලා හා තුමියන්ලා එයට
ඔවුන්ගේ බලාපොරොත්තු නම් තීන්ත බිඳු
තම දැනුමින් හා අත්දැකීම් වලින් වර්ණවත් කොට
සැලියට දැමීය.
දිනෙන් දින දැමූ මෙම වර්ණයන් නිසා
වසර තුනක් නමැති
කෙටි කාලය තුලදී
අපූර්ව වර්ණයක් ලැබීය
එය හුදෙක් මුල් වර්ණයට නෑකම් නොකීවකි

මෙම අපූර්ව වර්ණය මිනිස්කම හඳුනන
ප්‍රතිමූර්තිය බවට පත්විය
මෙහි ගුප්තවූ ශක්තිය ඇත්තේය
වරෙක එය විදහා පෑවේය
මෙහි බලය එය තුලින්ම පාලනය වන්නකි.

ඇදුරන්ගේ බලාපොරොත්තු සඵල විය
ඇදුරෝ එක්ව සුභ මොහොතින් මේ
අපූර්ව වර්ණවත් දිය - දියට හැලීය
එය ගඟ දිය මත අපූර්වත්වයෙන් පැතිර ගියේය
සියල්ලෝ තුටු කඳුලු වැගිරෑහ

ඇදුරෝ නැවත හිස් සැලිය පිරවීමට රැගෙන ගියහ

ජී. ඩී. ජී. උදයංගනී කුමාරි.
2004 බී කණ්ඩායම,
හෙද විදුහල, කොළඹ.

## I can forget

*I feel isolated*
*Am I alone?*
*No. I am among thousands of new faces*
*So am I happy ?*
*No.*
*If not; am I sad?*
*No. I feel as if I am living in a dream*
*My mind always runs to my home*
*Even a blade of grass in my garden*
*I admire very much*
*Will I be able to forget all those?*
*Yes. when I take the last breath*

*D.C. Paranavithana,*
*B.Sc. Nursing Programme: 2005/2006 Batch,*
*University of Sri Jayewardenepura.*

## සිනහව



ප්‍රීතියට නැගී එන
හීතියට සැඟව යන
ඉක්මනින් පැතිර යන
භාවයකි සිත නෙත

කට කොනින් මතුව එන
නැවත මුව තුළට යන
සෝපාසයෙන් නගන
සාපයකි දුක මවන

නොදැන පිටතට පනින
මුකුළුවට පන පොවන
තව නෙතක් රතු කරන
හිස් හඬකි වින කටින

හදවතින් ගලා එන
දයාවෙන් ලොවට දෙන
අමා සුව බෙද දෙන
සෙත් කවකි සිත් නිවන ....

එම්. ඒ. චන්දිමා
2003 එ කණ්ඩායම්
හෙද විදුහල - කොළඹ

## කඳුළු හෝරාවක්..

වටපිටම කළුවරයි
ගහකොළද නිසසලයි
නිශා ඉම දහයේ කණීසම
ඇසෙන සඳ .....
විවර කළ කවුළුවෙන්
ඇසුණා මූසල හඬක්
දුක හැඟෙන අඳෝනාවක්

ගතට සවියක් දුන්න ...
නෙතට දසුනක් මැව්ව ....
හිතට දිරියක් දුන්න .....
පියකුගේ සමුගැන්මක ...
පියකුගේ සමුගැන්මක ....
හෝරාව විය එසඳ ...

අනේ ...! ඔුදු තාත්තේ
ඇයිද ..... අප තනිකළේ
ලෙසින් මොරදුන් පුතේ ...
බුදුන් දෙසූ දහම නුඹ
නොදන්නෙද පොඩි පුතේ

යමෙකු ලොව උපන්නොත්
"නියත බව මරණයත් "....

යූ. එල්. එන් දමයන්ති
2003 ඒ කණ්ඩායම,
හෙද විදුහල,
කොළඹ.

## I Love you

*There's a full moon glowing*
*outside my window,*
*I'm remembering your face*
*filled with love, patience & sympathy;*
*Being with you means*
*an everlasting warm feeling*
*in my heart ..............*

*I feel a closeness*
*when I'm with you,*
*when you are apart*
*that's a huge void*
*which can be filled*
*only by you ..........*

*My dearest Moralist,*
*Here;*
*I'm missing your hugs,*
*your voice and your endless love*
*you are the greatest and mightiest "AMMA"*
*in this entire universe.*
*I love you so much !*

*U.A. Renu Tharanga*
*2003 A*
*School of Nursing.Colombo.*

# Planning of Clinical Experience for Nursing Students

Clinical Experience is an essential part of the General Nursing Curricum and the student will be actively participating to obtain skills in clinical practice by applying the principle of "Learning by doing". The time the student spends and learns in the clinical field is an important part of the course.

The School of Nursing has to plan the clinical experience according to the objectives of the curriculum. It will provide the needed learning at a marked level in the course. Then the student will be assigned the right clinical area at the right time. The teacher has to orient the students they are assigned to the particular clinical area and he or she has to complete the essential theoretical component related to that clinical area before getting assigned to them. Students should be informed about the requirements they have to fulfill during the given period and type of desired learning behaviour.

**Factors to be considered for providing clinical facilities**

- Philosophy and objectives of the institution and educational programme.
- Health care delivery system.
- Methods of delivering nursing care.
- Standards for practice - evaluation tools
- Availability of hospitals with speciality facilities
- Other health agencies like rehabilitation centres
- Equipment and supplies.
- Role models
- Budget

**Principles in selection of learning experience in clinical area.**

- Learning experience should provide an opportunity for students to practice the type of suggested behaviour.
- Students must have time and opportunity to analyse the problems of specific patients, recognizing the emotional and social problems, which affect the medical status.
- Provide learning situations to assist in making and carrying out care plans.
- The activities must be within the range of possibility for the students.
- Students should acquire basic concepts for effective health teaching.

Some questions have to be answered before planning clinical experience,

- What is the background of the student ?
- When he / she comes to the clinical field ?
- How long he can be assigned ?
- What experiences he/she should receive to meet the objectives ?
- What experience could the ward offer the student?
- What is the student expected to gain from his/her experience ?

**Responsibilities of the nursing staff in the clinical area.**

The success of the clinical experience will depend to a great extent on the standard of patient care being practised in the clinical area.

Therefore,

- Demonstrate a high standard of patient care
- Create an atmosphere which encourges learning
- Assist the nursing tutors in preparation of the clinical rotation plan.
- Ensure that the student receives maximum learning experiences.
- Participate in orientation programmes of students.
- Guide, supervise and evaluate the students performance.
- Participate and cooperate in clinical teaching, nursing and clinical conferences.
- Cooperate in maintaining record of practical experience.

These are valuable aspects for preserving future professional roles and giving them the right direction in nursing.

References.

Bishop, C. (1998) Clinical Supervision in Practice. Great Britain, Creative Print and design.

Neeraja, K.(2003) Text Book of Nursing Education. Noida, Gopsons papers Ltd.

Deepika Samarasekara,
Nursing Tutor,
School of Nursing, Colombo.

---

From Page 05

**Professional Responsibilities**

Formulate a manageable action plan based on their experience and employment situation and then utilize the relevant information.

- The nursing courses need to include or update on disaster preparedness and response.
- Provide inservice training for the staff about the effects of a disaster on chronic health conditions
- Nurse managers to arrange continuing education for co - workers on disaster preparedness and management.
- Encourage contribution of community groups and volunteers.
- Engage in voluntary services in disaster situations.
- Improve evidence based practice

**Ranjanie Kulatunga** (B.A,Bsc.N)
Nursing Tutor,
School of Nursing,Colombo.

15 February 2006

# To Whom it May Concern

I am writing on behalf of the International Council of Nurses (ICN). a federation of national nurses associations in 129 countries representing more than 13 million nurses globally. As the international voice of nursing, ICN works to ensure quality care for all and sound health policies globally through a well prepared nursing workforce that is bound by a professional code of ethics and evidence-based care. We proudly count among our members the Sri Lanka Nurses Association.

We understand there are currently some discussions in Sri Lanka as to whether nursing constitutes a profession. We clearly affirm that nursing is a profession recognised globally with entitlements to all the rights and obligations of any other profession The recognition of nursing by United Nations organisations such as the World Health Organization and the International Labour Organization (ILO) provides clear evidence to the professional status that nursing and nurses enjoy. The ILO convention C149 of 1977, for example, sets out the working conditions, rights and privileges of nursing personnel as professionals.

Given today's complex health care systems and the demonstrated capacity of professional nurses, we believe that arguments about whether nursing is a profession or not belongs to the past. Internationally nursing is fully recognised as a profession and nurses are acknowledged as key health professionals who form the backbone of health care. The profession's scope of practice is well defined by nursing practice acts that are enacted by parliament. National professional organisations bear the responsibility for defining nursing and nurses roles that are consistent with accepted international definitions articulated by the International Council of Nurses, and relevant to their nation's health care needs.

While nurses, through professional, labour relations and regulatory bodies, bear primary responsibility for defining, monitoring and periodically evaluating roles and scope of practice, the views of others in society should be sought and considered in defining scope of practice.

The scope of nursing practice is not limited to specific tasks, functions or responsibilities but includes direct care giving and evaluation of its impact, advocating for patients and for health, supervising and delegating to others, leading, managing, teaching, undertaking research and developing health policy for health care systems. Furthermore, as the scope of nursing practice is dynamic and responsive to health needs, development of knowledge, and technological advances. Periodic review is required to ensure that it continues to be consistent with current health needs and supports improved health outcomes.

National nurses associations (NNAs) have a responsibility to seek support for legislation which recognises the distinctive and autonomous nature of nursing practice including a defined scope of professional practice. Finally I enclose a copy of the international code of ethics for nurses and, as well, urge you to visit the ICN website which holds many useful policy documents, standards and guidelines for the profession.

Judith A Oulton

Judith A. Oulton
Chief Executive Officer
International Council of Nurses

*Hayley Graphics, 889 1/16 Maradana Road, Colombo - 10 Tel : 2684015*